

පෙම් සටන

(පසුගිය කළාපයෙන්)

බොම්බයි මොටයි විකුණන කරත්තයකි. ලොකු වීදුරු පෙට්ටියකට බයිසිකල් රෝද සවිකර තනාගත් මොටයි කරත්තය තල්ලු කරගෙන යා හැකි පරිද්දෙන් නිම වී තිබුණි. පාට පාට මොටයි වීදුරු කරත්තය ඇතුළේ සිට අපගේ දිව තොල පත්තු කරයි. රටකජු විකුණන මැදි වයසේ ගැහැණියකි. විශාල රටකජු ප්‍රමාණයක් ලෑල්ලක් උඩ දමාගෙන තිබුණි. එවකට දැන් වාගේ රටකජු පොතු ඇර තිබුණේ නැත. ලෙලි පිටින් සත පහට දෙන රටකජු ගොටුව ලොකු ය.

තරමකට මත් පැනින් සප්පායම් වුණු සුද්ද බාප්පා සින්දුවක් කියා ගෙන ඉස්කොලේ වත්තට ඇතුළු වෙයි. බඩට පහළින් සරම ඇන්ද විට ඉදිරියට නෙරා ඇති බඩ මහා විශාල ය. කවුදෝ ළමයි කීප දෙනෙක් ''ජීවි බඩා බඩ ගෙඩියා'' කියමින් ඔහු වටේ කැරකෙති. එම ළමයින් ට ළඟට කතා කළ සුද්ද බාප්පා ඉනේ බැඳ තිබූ කළු පටියේ ඇති පොකැට්ටුවෙන් සත පහේ දාහයේ කාසි කීපයක් ගෙන දුන්නේ ය. සල්ලි ලැබුණු අපි මොටයි කඩය ළඟ පොරකකා මොටයි මිල දී ගත්තෙමු.

''තව ස්වල්ප වේලාවකින් නාට්‍ය පෙන්වන බව'' ශබ්ද විකාශන යන්ත්‍රය පැය ගණනක සිට මොරදෙයි. ගමේ අය පමණක් නොව පිට පළාත් වලින් ද බොහෝ සෙනඟ පැමිණ ඇත. ඉස්කෝලේ ශාලාව අතුරු සිදුරු නැතුව පිරිලා ය.

දැන් උණුසුම එන්න එන්නම වැඩි ය. එකිනෙකාගේ තොරතෝන්චියක් නැති වරුවුරුව මහා ගාල ගෝටියකි. එම හඬ දෙබෑ කරගෙන තව ස්වල්ප වේලාවකින් නාට්‍ය පෙන්වන බව ළඟ ළඟ පවසමින් ශබ්ද විකාශනය දෙසවන් සනසයි.

වේදිකාව පසුබිමේ විශාල පින්තූරයක් සහිත තිරයකි. හකුළන දිගහරින ඉදිරිපස තිරයද පාට පාට පින්තූරයකින් සැරසී තිබිණි. "ඔබ මෙතෙක් පුලපුලා බලාපොරොත්තුව සිටින ''පෙම්සටන'' ටික්ටර් එක දැන් වේදිකාවට ගෙන ඒමට අපේ නළු නිළියෝ ලක ලැහැස්ති වී අවසාන බව ප්‍රීතියෙන් දැනුම් දෙමු. තව ඉතා සුළු මොහොතකින් ''පෙම් සටන'' නාට්‍යය ඔබට දැක ගැනීමට හැකිවනවා ඇත."

තවත් පැය කාලකට පමණ පසු කීප දෙනෙක් ම තැනින් තැන එල්ලා තිබුණු පැට්‍රෝමැක්ස් ලාම්පු බිමට බා හුළං ගැසුවෝ ය.

පොඩිවුන්ගේ තොල් අතර රැඳවුණු නළා ශබ්දය මහා ඝෝෂාවකි. ඒත් එක්කම පුම්බන ලද බැලූනයක් පුපුරා යන ශබ්දයකි. මට මතක විශේෂ නළා වාර්යයක් ගැන සඳහන් කළ යුතුය යි සිතමි. පොඩි බට කුඹලක පුංචි බැලුම් බෝලයක් ඇත. බට කුඹල වටේ ඡේප් කඩදාසි ඔතා ඇත. බැලුම් බෝලය සවි කර තිබුණු තැන පාට කරන ලද කුකුළු පිහාටු කිහිපයක් සවිකර තිබිණි. මෙම නලාව පිඹින්නේද අමුතු ම ආකාරයකට ය. බැලුම පිම්බෙන තුරු බට කුඹල කටට තබා පිඹිය යුතු ය. ඉන්පසු කටින් ඉවතට ගන්නා නලාවෙන් බැලුම් බෝලය තුළ ඇති වාතය අවසන් වන තුරු කී..ඊඊඊඊඊඊ.....යනුවෙන් ශබ්දය පිට වේ.

"නෝනාවරුනි, මහත්වරුනි, මව්වරුනි, පියවරුනි, පුංචි දරුදැරියනි. මෙන්න ඔබ මෙතෙක් පුල පුලා නො ඉවසිල්ලෙන් බලා සිටි පෙම් සටන නාට්‍යය." නිවේදක මහතාගෙ කටහඬ කෙමෙන් අඩුවන විට සර්පිනාවේ හඬ ''දන්නො බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ද'' අනුවාදනය විය. ඒ සමගම වේදිකාවේ තිරය ක්‍රමයෙන් දෙපැත්තට ඇදී යනවා පෙනුණි. තොරතෝන්චියක් නැතිව පැවතුණු වරුවුරු ශබ්දය නැවතී සියළුම නෙත් වේදිකාව වෙත එල්ල වී තිබුණු අතර කන් අඩි දෙබෑකරගෙන නැගුණු අත්පුඩිය අතරට විසිල් හඬ කීපයක් ද එක්විණි.

නාට්‍ය පෙන්වන අතරතුර පැවැත්වෙන ප්‍රීති ඝෝෂාද, විසිල් හඬද, සමහර විටක පවතින දැඩි නිශ්ශබ්දතාවය ද, සමහර විටෙක හයියෙන් ම සිනාසෙන ශබ්දයද, නාට්‍යයේ චමත්කාරය පිටට පෙන්වනවා වැනි විය.

''තුන් දෙනගෙ අපේ -බැඳි මිතුදම මේ
දිවි තිබෙන තුරා - නෑ සැකා - බෝකල් පවතිනවා''

යනුවෙන් ඇරඹුණු ගීතය "පෙම් කැකුළ පිපී ගීතයේ" තනුවට සැකසුනකි.

නාට්‍යයේ ප්‍රධාන චරිතයක පියාගේ චරිතයට පණ පෙවූ පීතර බාප්පා ගේ මුවින් කියැවුණු ගීතයේ මුල් වචන පේලි කීපය මෙසේ ය.
''මගේ පුතා ගොස් යුනිවසිටියේ - සිටියේ
ඒ හින්දයි ඒ හින්දයි කොළඹට
පය තැබුවේ
කන්දක් හෙම නැග්ගෝතින්
දුකසේ - දුකසේ
නෑ සංකා නෑ සංකා
පල්ලමකුත් හමුවේ.''

ඩයිලියස් විජේරත්න මහතා කළ විකට ජවනිකාවේ මෙලෙස ඇරඹුණු ගීතයක් කියැවිණි.
''සිංහල අවුරුදු කන්න
හිතාගෙන
ආවා නුඹව සොයා
ගල්ඔය පැත්තේ මට හරි තත්තේ
බයි කෙල්ලො මගේ පස්සෙන් එන්නේ ''

මෙවන් ගීත, විකට ජවනිකා, බිය ජනක දර්ශන, පෙම් ජවනිකා , සටන් ආදියෙන් යුතුව නිමාවුණු ''පෙම් සටන'' ගැන ඊට පසුදා මුළු ගමේ ම කතාව ය. නළු නිළියන්ගේ දක්ෂතාවය ගැන කතාවනවා පමණක් නොව නාට්‍යයේ ඇති සමහර දෙබස් ද, ගීත ද විටින් විට මුවින් මුව කියැවෙන අවස්ථා ද බොහෝ තිබුණි. නාට්‍යයේ චමත්කාරජනක සුන්දරත්වය බොහෝ කාලයක් අපේ ගමේ පිරිසට මතක තිබෙන්නට ඇත.

පසු කලකදී ඉතා දක්ෂ නළුවෙකු මෙන්ම නාට්‍යයන් අධ්‍යක්ෂණය කළ ලාල් වීරක්කොඩි වශයෙන් හැඳින්වුණු උමේසේන අයියා ද අපට වඩා අවුරුදු කිහිපයකින් වැඩිමහල් ළමයෙකි. විකට චරිත තුළින් ඔහු දක්වූ දස්කම් අදත් අපගේ සිත් තුළ නාට්‍යමය චමත්කාරයක් දනවයි. විශේෂයෙන් සඳහන් කළ යුතු අයකු වන ලාල් මහතා පසු කාලයේද බොහෝ නාට්‍ය පෙන්වා ගමේ පිරිස ප්‍රබෝධමත් කිරීමට මහන්සි ගත් අයකු මෙන් ම ගමේ සෑම පොදු කටයුත්තක දී ම වාගේ පෙරමුණ ගෙන ක්‍රියා කළ කෙනෙකු බව ඔහුට ගෞරවයක් වශයෙන් සඳහන් කිරීම වටී.

එසේ ම ප්‍රේමතිලක බාප්පාද ඉතා දක්ෂ නිළියකි. ගමේ පෙන්වූ බොහෝ නාට්‍ය වල ප්‍රධාන නිළිය ලෙස චරිත නිරූපනයේ යෙදුණු අපූරුව සතුටින් සිහිපත් කළ හැකි ය. සාරිය හැඳ, කොණ්ඩය ගොතා ලාලිත ගමනින් වේදිකාව හැඩකරන ඔහු බොහෝ හොඳින් දන්නා අයකුට මිස අඩු වශයෙන් පිරිමියෙක්දැයි කියා අඩමාන කිරීමටවත් නූපුළුවන. ඔහු පසු කාලීනව ගමේ පැවැත්වුණු වෙනත් නාට්‍යයක පිරිමි චරිතයක් නිරූපනය කළද කලින් රඟ පෑ නිළි චරිතයේ තිබුණු තාත්විකත්වය එහි නොපෙනුණු බව පැවසීමට හැකි ය. ගැහැණු චරිත දක්ෂ ලෙස නිරූපනය කළ තවත් අය වශයෙන් අසෝක ජයරත්න, සෝමදාස සහ රොමියෙල් යන අය සිහිපත් කළ හැකි ය.

"හද යළි පනගන්වයි - තනි තරුවේ"

මේ මාසයේ දහ අටවෙනි දා සවස හය හමාරට මොනෂ් සරසවියේ රොබර්ඩ් බ්ලැක්වුඩ් ශාලාවේදී මෙල්බර්න් නුවරට නුහුරු දෙයක් කෙරෙනවා. ශ්‍රී ලංකාවේ ජන සමාජයට අනුපමේය මෙහෙවරක් කළාවූ කලාකරුවෙකුට උපහාර පිදීමයි ඒ. ශ්‍රී ලංකාවේ සිංහල ගීත වංශ කතාවේ නොමැකෙන සටහනක් තියපු වික්ටර් රත්නායක ගාන්ධර්වයාණන්ට එතුමාගේ ගායන හා නිර්මාණ දායකත්වය වෙනුවෙන් කෙරෙන්නා වූ උපහාරයයි ඒ. තමන්ට වගේම අනුන් වෙනුවෙන් ද සිය ගණනින් තනු හා සංගීත නිර්මාණය කර දෙමින් ද, තමන්ගේ හඬින් ගීත සිය දහස් ගණනක් ගීත ගයමින් ද, නවක ශිල්පීන් සිය නිර්මාණ තුළින් හඳුන්වා දෙමින් හා ඉදිරියට ගෙන එමින් ද "ස" ඒක පුද්ගල සංගීත ප්‍රසංග යෙන් දේශ දේශාන්තරවල පවා රසිකයින් සනහාලමින් ද, සරු වූත් නිර්මාණාත්මක වූත් නැවුම් නිර්මාණ රැසක් ක්ෂේත්‍රයට දායාද කරමින් ද හතළිස් පස් වසරක් තුළ එතුමන් කළාවූ සේවයට කෙරෙන්නා වූ උපහාරයයි ඒ.

ප්‍රවීණ සංගීතවේදී රෝහණ ධර්මකීර්ති ඇතුළු මව්බිමේ ප්‍රවීණ වාද්‍ය ශිල්පීන් රැසක් මෙල්බර්න්හි ශිල්පීන් සමගින් කෙරෙන්නාවූ සංගීත සංගායනාව මෙල්බර්න් තරුණයින් සමගින් ඉදිරිපත් කරන්නේ ප්‍රවීණ රංගනවේදී රවින්ද්‍ර රන්දෙනියයි. "සිංදු කියන දොස්තර" නමින් ලංකාවේ හඳුන්වන ආනන්ද ගුණසේකර වෛද්‍යවරයා සමගින් මෙල්බර්න් ශිල්පී ශිල්පිනියන් ද ගායන වෘන්දයක් ද එයට එක් වෙනවා ඇති. අප අතර වෙසෙන ජ්‍යේෂ්ඨ ප්‍රවීණ සංගීතවේදී ෂෙල්ටන් ප්‍රේමරත්නයන් ද ප්‍රසංග යට එක් වන්නේ ගෞරවනීය ආරාධිතයෙක් වශයෙන්. මේ සියළු චමත්කාරයන් මැදේදේ ගීතවත් වන්නේ වික්ටර් රත්නායකයන්ගේ ස්වර්ණමය ස්වරයයි.

කුරුණෑගල ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ ආනන්ද ගුණසේකර වෛද්‍යවරයා ප්‍රසංග යට සහභාගි වන්නේ උත්සවය සංවිධානය කරන්නා වූ ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියා පරිත්‍යාග ශීලී සෞඛ්‍ය අරමුදල මව් බිමේ ක්‍රියාත්මක කරවන හද යළි පණගැන්වීමේ ව්‍යාපෘතියේ නියාමකයා විදියටයි. උත්සවය මෙල්බර්න් නුවර සිට සංවිධානය කිරීමට මුල් වී සිටින්නේ හෘදය රෝග පිළිබඳව විශේෂඥ රංජිත් හෙට්ටිආරච්චි වෛද්‍යවරයායි.

හෘදයාබාධවලින් දුර්මුඛව ඇදවැටෙන රෝගියෙකු නැවත යථා තත්වයට පත් කර ගැනීමට වුවමනා කරනා දැණුමත්, පුහුණුවත්, උපකරණත්, ප්‍රථමාධාර සමගින් හැකි ඉක්මණින් රෝහලක් වෙත ගෙන යාමට වුවමනා කරන ගිලන් රථ යනාදියත් රෝ-ගියා වෙනුවෙන් රෝහලේ සායන, සයන යනාදී අවශ්‍යතාත් සපුරා ලබා දීමේ අරමුණින් ය. "හද යළි පණ ගැන්වීමේ ව්‍යාපෘතිය ඇරඹුනේ. හෘදය සම්පූර්ණයෙන්ම ක්‍රියා විරහිත වී රෝගියා මිය ගිය තත්ත්වයට පත් වුවද යම් කිසි කාල සීමාවක් ඇතුලත නිසි ප්‍රථ මාධාරත්, ප්‍රතිකාරත් ලැබුණහොත් හදවත යළිත් ක්‍රියාත්මක කරවාගත හැකි බවය හෙට්ටිආරච්චි වෛද්‍යවරයාගේ අදහස. එය තමන්ගේ දීර්ඝ කාලීන අත්දැකීම් හා දැණුම් සම්භාරයෙන් අවබෝධ වුණ දෙයක්.

වැඩපිළිවෙල 2008 ජනවාරි මාසයේ කුරුණෑගලදී දියත් කෙරුණා. එයට සම්පත් සොයා ගන්නට මෙල්බර්න් නුවරදී පසුගිය අවුරුද්දේ "හද පුබුදු ගී" නමින් ප්‍රසංගයක් පැවැත්වුණා. එහිදී ගුණසේකර වෛද්‍යවරයා, බණ්ඩාර අතාවුද, කිත්සිරි ජයසේකර, කුමාරි මුණසිංහ, වාගේ ප්‍රවීනයින්ගේ ගායනාවලට එක්වුණෝ රෝහණ ධර්මකීර්ති සංගීතවේදියාගේ සංගීතයට. ඒ වෙනුවෙන් මෙල්බර්න් නුවරින් උරදුන්න පිරිස ගැනත් සිහිපත් කළයුතු වෙනවා.

කුරුණෑගල රෝහලේ හෘදය රෝග අංශය වෙනුවෙන් ගිලන් රථයක් පිරිනැමීම අරමුදල වෙනුවෙන් හෙට්ටිආරච්චි වෛද්‍යවරයා අතින් ඉටු කෙරුණා. හද පණ ගැන්වීමේ උපකරණයක් (ඇපජර්ස්සාබබ්ඩසා) ඇතුලු ආම්පන්න තොගයක් ද සමගින් රෝහලේ කණ්ඩායමක් පුහුණු කරමින්ද, වෙනමම හදිසි දුරකථන අංකයක් ස්ථාපිත කරමින්ද, කෑගල්ල ප්‍රදේශයේ සහ වෙනත් ස්ථාන කිහිපයක දේශන හා වැඩමුළු පවත්වමින් ද ව්‍යාපෘතියේ මූලික පියවර සියල්ල මේ වන විටත් හමාර කර හමාරයි. සැම දෙනාම දැනුවත් කිරීමේ පියවරක් විදියට ටෙලි නාට්‍යංග දෙකක් නිශ්පාදනය කිරීමත් ඒ හමාර කළ පියවරවලට ඇතුලත්. ඒවායේ රඟපෑවේ ප්‍රවීණ රංගනවේදී රවීන්ද්‍ර රන්දෙණිය ශිල්පියායි. අධ්‍යක්ෂණය සුනිල් රත්නායක ප්‍රවීණයාගෙන්. වෛද්‍යමය උපදෙස් සහිතව අධ්‍යක්ෂණ සහය වෛද්‍ය හෙට්ටිආරච්චිගෙන් ලැබුණා. සෞඛ්‍ය කටයුතු හා පෝෂණ අමති ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ අතින් විවෘත වුණ හලාවත රෝහලට ගිලන් සායන පරිත්‍යාගයක් ද අරමුදලින් කෙරුණා.

මෙරට වෙසෙන ශ්‍රී ලාංකික සම්භවයක් තියෙන අයගේ හෘදය රෝග පිළිබඳව දැනට කරගෙන යන සංගනනය ව්‍යාපෘතියේ ඉදිරි පියවර අතරින් එකක්. මේ වෙනකොටත් සිය දෙනෙකු විතර තොරතුරු රැස්කරගෙන හමාරයි.

යහපත් අරමුණින් කරගෙන යන වැඩපිළිවෙලකට යම් තරමකින් හරි දායක වෙන එක යහපත් දෙයක්. ඉටු කරන්නට අවශ්‍ය යුතුකමක් නොරටකදී හරි කරන්නට අරමුදල කල්පනා කිරීම වැදගත්. අප හැමෝම හැකි පමණින් ඒ සද්කාර්යටත් සහභාගි වීමත් වැදගත්. වික්ටර් රත්නායකයන්ගේ ගායනා උසවිඳිමින් එතුමන්ට උපහාර දැක්වීමට එක් වීම එතුමන්ගේ ගීත රසවින්ද අපගේ කෘතවේදී බව කියාපාන්නක්.

සිසිර දිසානායක